සැ. යු.- (i) 2014.05.30 දින පළ වූ අංක 1,865 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,866 - 2014 ජූනි මස 06 වැනි සිකුරාදා - 2014.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 888 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 895 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්*, 2014 ජූනි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූනි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

885- B 80845—2,875 (2014/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**(සමාජ සේවා අමාත්‍යාංශය)**

**01. තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුරු 03**

01. *වයස් සීමාව.*- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

(ආ) පළපුරුද්ද :
රජයේ හෝ රජය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක වසර 10 කට නොඅඩු සමාජ වැඩ අධ්‍යයන හා ඉගැන්වීම් අංශයන්හි පළපුරුද්දක් තිබීම.

03. *වැටුප් පරිමාණය* .- AR-2-2006A - රු. 34,550- 10 x 925 - රු.43,880 (මාසිකව)

**02. තනතුර : ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරි - තනතුරු 03**

01. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් ලබා තිබීම;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10 කට නොඅඩු සමාජ වැඩ පුහුණු කිරීමේ අංශයන්හි පළපුරුද්ද;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15 කට නොඅඩු සමාජ වැඩ පුහුණු අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම.

03. *වැටුප් පරිමාණය* : AR-2-2006A - රු. 34,550- 10 x 925 - රු.43,880 (මාසිකව)

*සැ. යු.* :- මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ වසරකට වඩා නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**03. තනතුර : ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි - තනතුරු 03**

01. *වයස් සීමාව* .- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

2. *අධ්‍යාපන සුදුසුකම් :*

ආ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් ලබා තිබීම;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10 කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම;

හෝ

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15 කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම.

03. *වැටුප් පරිමාණය* .- AR-2-2006A - රු. 34,550 - 10 x 925 - රු.43,880 (මාසිකව)

**04. තනතුර : ඉංග්‍රීසි උපදේශක III - තනතුරු 01**

01. *වයස් සීමාව* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව විෂයයක් සහිතව ලබාගත් උපාධියක්;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්‍රමවේදය සහිත උපාධිය;

සහ

(ඇ) ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම;

හෝ

(ඉ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ රජයේ පාසලක හෝ වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

03. *වැටුප් පරිමාණය* : MA4 -2006A - රු. 18,230 - 10 x 365 - 15 x 450 - 5 x 550 - රු.31,380

**05. තනතුර : භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) III - තනතුරු 01**

01. *වයස් සීමාව* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

02. *අධ්‍යාපන සුදුසුකම්* :

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලක සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් සහ අ.පො.ස. උසස් පෙළ සිංහල හා ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීම සහ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්ථනය පිළිබඳ නිපුනතාවය ;

සහ

ආ. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02 ක පළපුරුද්ද

03. *වැටුප් පරිමාණය* .- MA-4-2006A- රු. 18,230 - 10 x 365- 15 x 450 - 5 x 550 - රු.31,380

**06. තනතුර : ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික III - තනතුරු 01**

01. *වයස් සීමාව* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි)

02. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය, සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂයය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධක මට්ටම ලබා තිබීම.

(ඇ) තාක්ෂණික නිපුනතා/ප්‍රවීණතා

එක් එක් තනතුරෙහි කාර්යයභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

03. *වැටුප් පරිමාණය* .- MA 2-2-2006A- රු. 14,610 - 10 x 145- 7 x 170 - 4 x 290 - 20 x 345- රු.25,310

සියලුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි

1. තනතුර ස්ථිරය ;
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය ;
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.

*සටහන* .- මෙම තනතුරු පුරප්පාඩුව පවතින්නේ නාවල, රාජගිරියේ ප්‍රධාන කාර්යාලයේ වන අතර මෙම ආයතනයට කිසිදු ශාඛාවක් නොමැත. තෝරා ගන්නා අයදුම්කරුවන් පහත සඳහන් ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කළ යුතු ය.

*සේවා කොන්දේසි* .- 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2014.07.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2014 මැයි මස 21 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488, ඒ, නාවල පාර, රාජගිරිය.

06-86

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2014.08.15 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

තව ද මෙම නිලධාරීන් අනෙකුත් රජයේ නිලධාරීන්ට හිමිවන ජීවන වියදම් දීමනාව සහ අංක 31/11 සහ 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ලබාදී ඇති දීමනාවට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) දුෂ්කර දීමනා සඳහා රු. 2,000

(ආ) සංයුක්ත දීමනා :
(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500
(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(ඇ) නොමිලේ ගමන් පහසුකම්,

(ඈ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඉ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඊ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(උ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව :*
*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට* වයස අවුරුදු 19 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 32ට නොවැඩි විය යුතුය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය.

*සටහන 01*.- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* .- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03*.- වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම් :*

* *උස අඩි 05 යි. අඟල් 03 යි. (අවම),*
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඇ) *වෘත්තීය සුදුසුකම් :*

(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පලපුරුද්දක් තිබිය යුතුය.

*සටහන*.- මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පලපුරුද්ද, රිය පැදවීම දිගුකාලීන පලපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අයදුම්කරුවෙකු වෙතොත් එම අයදුම්කරු සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්‍ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අයදුම්කරුවන් ලබා ඇති දැනුමත්, එක් එක් අයදුම්කරුවා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්‍ෂා කරනු ලැබේ.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම් :*

* විවාහක හෝ අවිවාහක අයවලුන්

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 03, තත්පර 44.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *වෘත්තීය සුදුසුකම් :*

6.1 වෘත්තීයමය පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්‍ෂකගේ අධීක්‍ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්‍ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා ලකුණු 100ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්‍ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| *(අ)* | රිය පැදවීමේ ප්‍රවීනතාවය | ලකුණු 50 |
| *(ආ)* | මාර්ග නීති උපදේශක සංග්‍රහය | ලකුණු 25 |
| *(ඇ)* | වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | ලකුණු 25 |

6.3 වෘත්තීයමය පරීක්‍ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නිති උපදේශක සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබාගෙන වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබා ගෙන ඇති අයදුම්කරුවන්

වෘත්තීයමය පරීක්‍ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

සටහන.- බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් ආධුනික කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය.

07. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණයට බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි* :

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ/අවිවාහක නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ ආධුනික නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි ආයතන සංග්‍රහයේ 1 වැනි බාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන්, සේවය ස්ථිර කිරීමෙන් පසු පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

(උ) රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්.

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතු ය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සටහන.— *පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.*

*එන්. කේ. ඉලංගකෝන්,*
*පොලිස්පති*
*පොලිස් මූලස්ථානය*
*කොළඹ 01.*

***පොලිස් දෙපාර්තමේන්තුව***

***පොලිස් කොස්තාපල් තනතුර***

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකතන අංකය - නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

වයස :— (ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————. පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන්කර සහතිකවල ඡායා පිටපත් ඇමිණිය යුතු ය) :————.

10. (අ) රියදුරු බලපත්‍ර අංකය :————.

(ආ) රියදුරු බලපත්‍රය ලබාගත් දිනය :————.

(ඇ) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :————.
(රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

11. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

12. විවාහක/අවිවාහක බව :————.

13. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

14. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———,
(ආ) ———.

16. (අ) ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේ ද ? :———.
(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න :———.

17. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න :———.

18. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

19. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

20. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ?

(එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

21. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

06-187

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජූලි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මැයි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | හාලිඇල | හාලිඇල කොට්ඨාසයේ මාළිගාතැන්න උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

06-105

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජුනි මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මැයි මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | අඹගමුව | නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය කොට්ඨාසයේ බගවන්තලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

06-47

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — යාපනය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජූලි මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මැයි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| යාපනය | කයිට්ස් | එළුවයිතිවු කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කයිට්ස් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | වේලනයි | ඇල්ලයිපිට්ටි කොට්ඨාසයේ | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| | | උප්පැන්න මරණ සහ වේලනයි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | වේලනයි | පුංගුඩුතිවු කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වේලනයි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | කරෙයිනගර් | කරෙයිනගර් කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | කරෙයිනගර් | කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | යාපනය | යාපනය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | වන්කානයි | වඩ්ඩුකෝඩ්ඩයි කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වන්කානයි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | කෝප්පායි | පුත්තූර් කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කෝප්පායි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | පේදුරු තුඩුව | කඩ්ඩයිවේලි කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ පේදුරු තුඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |

06-27

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ)***
***III පන්තියේ උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2014***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III වන පන්තියේ පහත සඳහන් උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු අංකය* | *තනතුර* | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* | *ඉංග්‍රීසි මාධ්‍ය* |
|---|---|---|---|---|
| 1. | උපදේශක (ඉලෙක්ට්‍රොනික්) | 10 | 04 | - |
| 2. | උපදේශක (ගොඩනැගිලි වෘත්තීය) | 39 | 09 | - |
| 3. | උපදේශක (මෝටර් යාන්ත්‍රික) | 29 | 08 | - |

| තනතුරු අංකය | තනතුර | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
|---|---|---|---|---|
| 4. | උපදේශක (ලී වැඩ) | 40 | 04 | - |
| 5. | උපදේශක (ශීතකරණ හා වායුසමීකරණ) | 08 | 02 | - |
| 6. | උපදේශක (කාර්මික චිත්‍ර) | 35 | 08 | - |
| 7. | උපදේශක (විදුලි) | 27 | 09 | - |
| 8. | උපදේශක (ඉංග්‍රීසි) | - | - | 32 |
| 9. | උපදේශක (පරිගණක තාක්ෂණය) | 20 | 03 | - |
| 10. | උපදේශක (විද්‍යා/ගණිත) | 24 | 07 | - |
| 11. | උපදේශක (වාණිජ) | 34 | 09 | - |
| 12. | උපදේශක (ලෝහ වැඩ) | 29 | 06 | - |
| 13. | උපදේශක (ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය සහ නිෂ්පාදනය) | 02 | - | - |
| 14. | උපදේශක (කෘෂි කර්මය) | 06 | - | - |
| 15. | උපදේශක (ලඝුලේඛනය හා යතුරුලියනය) | 14 | 06 | 18 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය* .-

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III වැනි පන්තියේ උපදේශක පුරප්පාඩු සඳහා විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පත්වීම් බලධරයා වෙනුවෙන් මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

02. *සුදුසුකම්* .-
සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) ශ්‍රී ලාංකිකයකු විය යුතු ය ;
(ii) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය;
(iii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(iv) පහත පරිදි පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ගැනීමෙන් පසුව වසර 03 ක ඉගැන්වීමේ/කර්මාන්ත ක්ෂේත්‍ර පළපුරුද්දක් ලබා තිබිය යුතු ය

| අනු. අංකය | තනතුර | අධ්‍යාපන/වෘත්තීය හා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් |
|---|---|---|
| 1. | උපදේශක (ඉලෙක්ට්‍රොනික්) | - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;<br>*හෝ*<br>- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව(ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ) ;<br>*හෝ*<br>- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු ඉලෙක්ට්‍රොනික්) ;<br>*හෝ*<br>- ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) ;<br>*හෝ*<br>- ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ තාක්ෂණිකයින්ගේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;<br>*හෝ*<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;<br>*සහ*<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම ; |

*සහ*

ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද'

2. උපදේශක (ගොඩනැගිලි වෘත්තිය)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක්;

*හෝ*

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) ;

*හෝ*

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) ;

*හෝ*

- ජාතික තාක්ෂණික සහතිකය (සිවිල් ඉංජිනේරු) ;

*හෝ*

- ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;

*හෝ*

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබාතිබීම. (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

3. උපදේශක (මෝටර් යාන්ත්‍රික)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මටට්මේ අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;

*හෝ*

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු මෝටර් යාන්ත්‍රික විද්‍යාව) ;

*හෝ*

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු මෝටර් යාන්ත්‍රික විද්‍යාව) ;

*හෝ*

- ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ;

*හෝ*

- ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;

*හෝ*

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන

*හෝ*

උසස් සුදුසුකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

4. උපදේශක (ලී වැඩ)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක්

*හෝ*

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික/සිවිල් ඉංජිනේරු)

*හෝ*

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික/සිවිල් ඉංජිනේරු)

*හෝ*

- ජාතික තාක්ෂණික සහතිකය (සිවිල් ඉංජිනේරු/යාන්ත්‍රික ඉංජිනේරු)

*හෝ*

- ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබාතිබීම. (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්);

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම සහ

ඉහත සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

5. උපදේශක (ශීතකරණ හා වායුසමීකරණ)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;

*හෝ*

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික/නිෂ්පාදන ඉංජිනේරු) ;

*හෝ*

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු ශීතකරණ හා වායුසමන) ;

*හෝ*

- ජාතික තාක්ෂණික සහතික (යාන්ත්‍රික ඉංජිනේරු) හෝ ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ) පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්);

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) සමත්වීම

සහ

ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

6. උපදේශක (කාර්මික චිත්‍ර)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ කාර්මික චිත්‍ර විෂයක් වශයෙන් ඇතුළත් පාඨමාලාවක් ;

හෝ

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු)

හෝ

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු)

හෝ

- ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ; හෝ ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්);

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම සහ

ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව වසර පහක අදාළ ක්ෂේත්‍රයේ ඉගැන්වීම සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

7 උපදේශක (විදුලි)

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ විදුලි තාක්ෂණය විෂයක් වශයෙන් ඇතුළත් පාඨමාලාවක් ;

හෝ

- ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) ;

හෝ

- උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු) හෝ

- ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු)

හෝ

- ලන්ඩන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

ඉහත සඳහන් සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

8 උපදේශක (ඉංග්‍රීසි)

- ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය ;

*සහ*

- එම සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ වසර 03 ක පළපුරුද්ද ;

*හෝ*

- ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබාගැනීමෙන් පසු ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ වසර 03 ක පළපුරුද්ද.

9. උපදේශක(පරිගණක තාක්ෂණය)

- පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විද්‍යාවේදී උපාධිය ;

*හෝ*

- පරිගණක විෂය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් විද්‍යාවේදී උපාධියක් ;

*හෝ*

- පරිගණක විද්‍යාව විෂයය සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් ;

*හෝ*

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය සමග තොරතුරු තාක්ෂණය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් ;

*සහ*

ඉහත සුදුසුකම් ලබාගත් පසු පරිගණක තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ හා/හෝ ප්‍රායෝගික වසර තුනක (03) පළපුරුද්ද;

*හෝ*

- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මගින් නිකුත් කරනු ලබන පරිගණක තාක්ෂණය පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා සහතිකය

*හෝ*

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;

*හෝ*

- සමාන හෝ උසස් සුදුසුකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;

*සහ*

ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පරිගණක තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ අවුරුදු පහක (05) පළපුරුද්ද.

| | | | |
|---|---|---|---|
| 10. | උපදේශක (විද්‍යා/ගණිත) | - | භෞතික විද්‍යාව හා ගණිතය (ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය) විෂයයන් වශයෙන් ඇතිව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම ;<br>සහ<br>උපාධිය ලබාගත් පසු ඉගැන්වීම පිළිබඳ වසර (03) ක පළපුරුද්ද. |
| 11. | උපදේශක (වාණිජ) | - | ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය හෝ වාණිජ්‍ය විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා තිබීම. |
| | | - | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාලයකින්/ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් වාණිජ්‍ය විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම ;<br>හෝ |
| | | - | සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;<br>සහ<br>සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ/ඉගැන්වීමේ අවුරුදු තුනක (03) පළපුරුද්ද. |
| 12. | උපදේශක (ලෝහ වැඩ) | - | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;<br>හෝ |
| | | - | ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ;<br>හෝ |
| | | - | උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික ඉංජිනේරු) ;<br>හෝ |
| | | - | ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු) ;<br>හෝ |
| | | - | ලන්ඩන් හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පූර්ණ තාක්ෂණික සහතිකය (අදාළ ක්ෂේත්‍රයේ) ;<br>හෝ |
| | | - | අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික මට්ටමේ සමාන හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබීම (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් පිළිගනු ලබන සුදුසුකම්) ;<br>සහ<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වීම ;<br>සහ<br>ඉහත සඳහන් සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද. |
| 13. | උපදේශක (ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය සහ නිෂ්පාදනය) | - | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඊට ඉහළ මට්ටමේ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;<br>හෝ |

- ස්වර්ණාභරණ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම පිළිබඳ ඩිප්ලෝමාව;

*සහ*

- අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

- ස්වර්ණාභරණ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම පිළිබඳ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද ;

14. උපදේශක (කෘෂිකර්මය)

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 ඊට ඉහළ මට්ටමේ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ;

*හෝ*

- අම්පාර හාඩි ජොෂ්ඨ කාර්මික විද්‍යාලය, කුලියාපිටිය කාර්මික විද්‍යාලය, දඹුල්ල කාර්මික විද්‍යාලය, කුණ්ඩසාලේ කෘෂි කර්ම පාසල හෝ පේරාදෙණියේ කෘෂිකර්ම පාසලෙන් ලබාගත් කෘෂිකර්ම ඩිප්ලෝමාව හෝ සමාන හෝ උසස් සුදුසුකම්.

- අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

- විෂයය පිළිබඳ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

15. උපදේශක (ලඝුලේඛනය හා යතුරුලියනය)

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ/කාර්මික විද්‍යාලයකින් ලබාගත් ලඝුලේඛනය සහ යතුරුලියනය පිළිබඳ උසස් සහතිකය සහ වාණිජ සහතිකය (පොත් තැබීම) අදාළ භාෂා මාධ්‍යයෙන් ලබා තිබීම හෝ සමාන හෝ උසස් සුදුසුකම් ;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම ;

*සහ*

- විෂයය පිළිබඳ වසර පහක ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත වන අතර තෝරාගන්නා අපේක්ෂකයින් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(ii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.

(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(iv) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ ) III වැනි පන්තියට පත්වී වසර 03 ක් එනම් පරිවාස කාලය ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(v) මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

04. *වැටුප් හා දීමනා* :-

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 22,935 - 645 x 10 - 790 x 8 - 1, 050 x17 - රු.53,555 වේ. (SL -1-2006) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ. වැටුප් වර්ධක ගෙවීම ඉහත 03(iv) ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට යටත් වනු ඇත.

05. ලිඛිත පරීක්ෂණය :-

විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇති සියලුම අයැදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. ඉංග්‍රීසි පිළිබඳ උපදේශක තනතුරට අයදුම් කිරීමට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධිය සුදුසුකම ලෙස ඉදිරිපත් කළ අයැදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන විශේෂ ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.

**විෂය නිර්දේශය**

පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් සමන්විතය :-

*සාමාන්‍ය දැනීම* *ලකුණු 100* *කාලය පැය 01 යි*

ආර්ථික, සමාජයීය, දේශපාලනික, භූගෝලීය කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුළ ඇති දැනුම පිරික්සීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇති අතර, බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. සියළුම ප්‍රශ්න අනිවාර්යය වේ.

*බුද්ධි පරීක්ෂණය* *ලකුණු 100* *කාලය පැය 01 යි*

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය, තීරණ ගැනීමේ ශක්තිය හා බුද්ධිමට්ටම විනිශ්චය කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හා කෙටි පිළිතුරු ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 50 කින් සමන්විත අතර සියළුම ප්‍රශ්න අනිවාර්යය වේ.

ඉංග්‍රීසි පිළිබඳ උපදේශක තනතුරට අයදුම් කිරීමට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධිය සුදුසුකම ලෙස ඉදිරිපත් කළ අයදුම්කරුවන් පෙනී සිටිය යුතු විශේෂ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය.

ලකුණු 100 කාලය පැය 3 යි

රචනය, ඇගයීම, සාරාංශ ලිවීම, අවබෝධය යන කොටස්වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

06. සම්මුඛ පරීක්ෂණය :

තරග විභාගයේ කුසලතාවය අනුපිළිවෙල අනුව සුදුසුකම් ලබන අයැදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.)

එක් එක් විෂය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩිය ලබාගත් අයැදුම්කරුවන්ගෙන් ඔවුන්ගේ එම ලකුණුවල එකතුව අනුව ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ලබන අතර, එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පවතින පුරප්පාඩු අනුව බඳවා ගනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

07. අයදුම්කිරීමේ ක්‍රමය.-

(i) ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, 08 සිට 12 තෙක් 02 වන පිටුවට ද ඉතිරිය 03 වන පිටුවට ගෙන, සකස් කර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යයෙන් පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපත් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලයට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ii) පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.07.07 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරෙහි "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වන පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) උපදේශක තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය. එක් තනතුරකට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවක් සඳහා අයදුම්කරන්නේ නම්, අයදුම්පතේ තමන් තනතුරු තෝරා ගන්නා අනුපිළිවෙල අනුව තනතුරු අංක හා තනතුරු නාමයන් සඳහන් කර එවිය යුතුය. ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් ලැබූ අය පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

(iii) රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයැදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

(iv) පහත සඳහන් ලියකියවිලි සියල්ලේම තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපතක් අයැදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය (සැ. යු.-අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ භෞතිස්ම සහතික භාරගනු නොලැබේ).
(ii) හැදෑරූ විෂයන්වල විස්තර සහිතව උපාධි සහතික හෝ අනෙකුත් අධ්‍යාපන සහතික,
(iii) පළපුරුද්ද සනාථ කෙරෙන වෘත්තීය සහ/හෝ තාක්ෂණික සුදුසුකම් දැක්වෙන සහතික
(iv) සිංහලෙන් දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය

08. විභාග දිනය :

(i) මෙම විභාගය 2014 සැප්තැම්බර් මස දී කොළඹ නගරයේ දී පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.
(ii) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබිණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපතක් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. විභාග ප්‍රවේශය :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්/කාරියන් හට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.
(ii) විභාග අපේක්ෂකයා තමාට නියම කර ඇති විභාග ශාලාවේ විභාගයට පෙනී සිටිය යුතුය. සියළුම අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීතිරීති *ගැසට්* නිවේදනයේ ආරම්භයේ පළකර ඇත.
(iii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. සාවද්‍ය තොරතුරු සැපයීමට පනවන දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පැවැත්වෙන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු විසින් සාවද්‍ය බව දැන දැනම තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් දෙයක් ඕනෑකමින් යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත්වනු ලැබේ.

12. විභාග ගාස්තු :
විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකුව නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001 -39026228 මුදල් ගිණුමට බැර කර ලබා ගත් ලදු පත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ මෙම *ගැසට්* පත්‍රයේ 3 වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 1986.08.15 දිනැති අංක 415 දරන රජයේ *ගැසට්* පත්‍රයේ සාමාන්‍ය 1 වන කොටස යටතේ ප්‍රකාශයට පත් කරන ලද "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය" කෙරෙහි ද අපේක්ෂකයින් ගේ අවධානය යොමු කරවනු ලැබේ. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 තෙක් ඡේදයන්හි වගන්ති තනතුරට ගැලපෙන පරිදි අදාළ වේ.

14. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා
සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූනි මස 06 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III පන්තියේ***
***උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2014***

| *අයදුම්කරන තනතුර* | *තනතුරු අංකය* | *විභාගයට අයදුම්කරන භාෂා මාධ්‍ය* |
|---|---|---|
| | | |
| ගැසට් නිවේදනයේ 05 ඡේදය අනුව විශේෂ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතු ද? ඔව්/නැත | | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් : උදාහරණ : SILVA A. B.

02. සම්පූර්ණ නම :—————.

03. (අ) රාජකාරි ලිපිනය :—————.

(ආ) පෞද්ගලික ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශපත් තැපැල් කරනු ලැබේ.)

(ඇ) පෞද්ගලික දුරකථන අංකය :—————.

04. (අ) ඔබ ශ්‍රී ලාංකිකයකු ද යන වග : ඔව් ☐ නැත ☐

05. (අ) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(අ) තනතුර හා පත්වීමේ දිනය :—————.
(ආ) තනතුර ස්ථිර ද තාවකාලික ද යන වග :—————.
(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :—————.
(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත් ද යන වග :—————.
(ඉ) දෙපාර්තමේන්තුව :—————.
(ඊ) ආයතනය/සේවා ස්ථානය :—————.

08. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ භාෂාවෙහි ප්‍රවීනතාවය පිළිබඳ සහතික ද ඇතුළුව)

| *සමත් වූ විභාගය* | *විශ්වවිද්‍යාලය/ආයතනය* | *සමත් වර්ෂය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

09. ඉගැන්වීම හා පලපුරුද්ද පිළිබඳ විස්තර :

| ඉගැන්වීම/සේවය කළ ආයතනයේ නම | තනතුර | ලබාගත් සහතික | කාලසීමාව | විෂයය ක්ෂේත්‍රය/ වෘත්තීය ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |

(අදාළ සහතිකවල සහතික පිටපත් ඇමිණිය යුතු ය)

10. කලින් දරන ලද තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව/ ආයතනය | සේවා ස්ථානය | තනතුර | ස්ථිර ද තාවකාලික ද යන වග | සිට | තෙක් | සේවා කාලය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

11. ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර දක්වන්න:-..............................................

12. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න:-..............................................

13. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද? එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න:- ..............................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

මා විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසිදු වන්දියක් නොලබා මා තනතුරින් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනට රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

ඉහත අයදුම්කරු සම්බන්ධයෙන් වූ අනු අංක 01 සිට 13 තෙක් සඳහන් තොරතුරු නිවැරදි බවත්, නිවැරදි විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

06-107

---

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

2014 මැයි මස 09 වැනි සිකුරාදා පළවූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1862 දරන ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී, II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක සහ III වැනි ශ්‍රේණියේ රේගු නියාමක තනතුරු සඳහාවන විවෘත තරග විභාග පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවූ නිවේදනය පහත පරිදි සංශෝධනය කෙරේ.

(1) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි, II වැනි ශ්‍රේණියේ රේගු පරීක්ෂක සහ III වැනි ශ්‍රේණියේ රේගු නියාමක තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

04 වැනි ඡේදය යටතේ සටහන ලෙස වන කොටස පහත පරිදි සංශෝධනය කෙරේ.

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතුය. කෙසේවුවද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ පෙනී සිට සමත් වූ අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට නැතහොත් දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ අධ්‍යාපනය ලද අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල හෝ දෙමළ භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයීමට හැකිවේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(2) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014 යන හිසින් යුතුව පළ කරන ලද නිවේදනයේ,

(i) පළමු ඡේදයේ අවසන් වගන්තිය වන "මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ" යන්න වෙනුවට "මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සතුවේ'' ලෙස ද,

(ii) එම නිවේදනයේ අවසානයේ 13 වැනි ඡේදයට පසුව යෙදෙන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 01 යන්න වෙනුවට, රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, රේගු මන්දිරය, අංක 40, කෙළින් වීදිය, කොළඹ 11 ලෙස ද, සංශෝධනය කෙරේ.

(3) තව ද, මෙම විභාගයේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2014.06.11 වැනි දින දක්වා දීර්ඝ කරන අතර, මෙම විභාගය සඳහා ඉල්ලුම්කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලිය යුතු 2014.06.04 දිනය වෙනස් නොකෙරේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.

06-151

---

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ " රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්" වේ. සේවය" යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන්හිදී "ශ්‍රී ලංකා පරිපාලන සේවය" වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

*ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර පහ (05) කින් සමන්විත වේ :-

(i) සාමාන්‍ය බුද්ධිය;
(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා;
(iii) ගෝලීය ප්‍රවණතා;
(iv) කළමනාකරණමය අභියෝග්‍යතාව ;
(v) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා.

*විභාග දිනය*.-මෙම විභාගය 2014 සැප්තැම්බර් මස කොළඹ නගරයේ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය*.- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව 172කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි*.-

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. මාසික වැටුප් පරිමාණය:-මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්. එල්. -1-2006 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ :-

රු. 22,935-10x645-8x790-17x1,050-රු.53,555 (මාසික)

6. බඳවා ගැනීමේ සුදුසුකම් :-

(අ) (*i*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;
(*ii*) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම. ;
(*iii*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සටහන.- උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

(ඇ) *වයස :*
අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර අවුරුදු විසිඅටට (28) නොවැඩි විය යුතු ය.

(ඈ) *සුදුසුකම් පිළිබඳ සීමාවන් ;*

(*i*) විවෘත තරග විභාගය සඳහා වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)

(*ii*) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(*iii*) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

7. *විභාග ගාස්තු.*-විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රායෝජනවත් විය හැකිය.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය.-*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේ ද, 3.0 සිට 6.0 තෙක් එහි දෙවැනි පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක). සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2014.07.07 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2013 (2014)" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඈ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම* :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත් එවා ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍ර ආරම්භයේ* පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන*.- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව*.—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්*.—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති *සුදුසුකම්ලත් උපාධිය* යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6(ආ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. *බඳවා ගැනීමේ ක්‍රමය*.-

14.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර පහ (05) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා | 100 | 50 |
| 3 | ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 4 | කළමනාකරණමය අභියෝගතාව | 100 | 50 |
| 5 | නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | 100 | 50 |

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

14.2 සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(i) සම්මුඛ පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් (02) කින් යුක්ත වේ.

(අ) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

(i) ඉහත අංක 06හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 01 කළමනාකරණ කුසලතාව | 10 |
| 02 නායකත්ව ගුණාංග | 05 |
| 03 සන්නිවේදන කුසලතා | 05 |
| 04 පෞරුෂය | 05 |
| එකතුව | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව හා අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iv) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

සැළකිය යුතුයි : සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

15. *ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය* :-

(01) සාමාන්‍ය බුද්ධිය ;

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 1/2යි- ලකුණු 100යි මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා ;

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය)

(03) ගෝලීය ප්‍රවණතා ;

ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව, ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(04) කළමනාකරණමය අභියෝගතාව ;

ගැටළු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං

විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා දෙන ලද මාතෘකා/තේමා සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි - ලකුණු 100යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය)

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 මැයි මස 22 වැනි දින,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය,<br>
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

[ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013 (2014)

Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Administrative Service - 2013 (2014)

**ඉල්ලුම්පත්‍රය**

1.0 මාධ්‍යය—<br>
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]<br>
සිංහල - 2<br>
දෙමළ - 3<br>
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුල් අකුරු අගට යොදා මුල් අකුරු සමග නම :———.<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)<br>
උදාහරණ : (GUNAWARDHANA, M. G. B. S. K.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :———.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :———.<br>
පුරුෂ - 0 :- අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]<br>
ස්ත්‍රී - 1

2.7 විවාහක/අවිවාහක බව :———.<br>
අවිවාහක -1 :- අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]<br>
විවාහක -2

2.8 ජන වර්ගය :<br>
අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]<br>
(සිංහල - 1, දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3<br>
මුස්ලිම් - 4, වෙනත් - 5).

2.9 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.10 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

2.11 සුදුසුකම් සැපිරිය යුතු<br>
2014.07.07 දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

2.12 දුරකථන අංකය : [ | | | | | | | | | ]

3.0 (i) උපාධිය ලද දිනය :——.<br>
(ii) විශ්ව විද්‍යාල/ආයතනය :———.<br>
(iii) ලියාපදිංචි වූ අංකය :———.<br>
(iv) බාහිර/අභ්‍යන්තර :———.<br>
(v) උපාධිය :———.<br>
(vi) විෂයයන් :———.<br>
(vii) පන්තිය :———.<br>
(viii) ඉහළ/පහළ :———.<br>
(ix) විභාග අංකය :———.<br>
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :———.

4.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

(ලදු පත නොගැළවෙන සේ මෙහි අලවන්න.)<br>
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

5.0 *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක...............හා

………… වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 8 (ඈ) පරිදි විය යුතු ය).

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන……………… (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ………… දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන)

දිනය :———.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි).

06-176

---

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2013 (2014)**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම නිවේදනයේ

(අ) "ලේකම්" යන පදයෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ය.

(ආ) "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා පරිපාලන සේවයයි.

02. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගය - පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ.

01. සාමාන්‍ය බුද්ධිය
02. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා
03. රාජ්‍ය පරිපාලනමය, විෂයානුබද්ධ අධ්‍යයනය 1 (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)
04. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

විභාග දිනය - මෙම විභාගය 2014 සැප්තැම්බර් මස කොළඹ නගරය තුළ දී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය*.- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයින් සම්බන්ධයෙන් සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

03. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 46 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

04. සේවා කොන්දේසි

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 හා 2009.02.20 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලටද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4.3 පත්වීම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

05. මාසික වැටුප් පරිමාණය :-

මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්. එල්. 1-2006 වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 22,935, 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555 (මාසික)

06. බඳවා ගැනීමේ සුදුසුකම් ඃ

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) අධ්‍යයන සුදුසුකම් සහ පළපුරුද්ද :

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම ;

සහ

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි වැටුප් කේත අංක එම්. එන්. 2-2006 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල්. 1-2006 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම ;

හෝ

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි වැටුප් කේත අංක එම්. එන්. 2-2006 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල්. 1-2006 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

සටහන ඃ

1. උපාධිය බලපවත්නා දිනය 2013.12.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.
2. ඉහත සඳහන් කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය සේවය සහ/හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

(ඇ) වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම්

(i) 2013.12.31 දිනට වයස් සීමාව අවුරුදු පනස් තුන (53) ට නොවැඩි විය යුතුය.
(ii) ඉහත 6 (ආ) හි සඳහන් සේවයක/තනතුරක ස්ථිරත්වය ලබා තිබීම.
(iii) පූර්වාසන්න අවුරුදු 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම.
(iv) පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

(i) සීමිත තරඟ විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2013.12.31 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13 ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි නොගැලවනසේ ඇලවිය යුතුය. මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 2:12 තෙක් පළමුවන පිටුවටද, 3.0 සිට 4(II) තෙක් දෙවන පිටුවටද, ඉතිරිය තුන්වන පිටුවටද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. මේ සඳහා පරිගණකයේ සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත්ද භාවිත කළ හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතුවේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටිමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඈ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2014 ජූලි මස 07 වැනි දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2013 (2014)' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

(ඇ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර. අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලුම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට ඇතුළුවීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළ කර ඇත.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

*සටහන.-* අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බල පත්‍රය

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය වලින් පමණක් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රාජ්‍ය සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබා ගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවකින් ම හෝ විය යුතුය.

*සටහන :* (i) අපේක්ෂකයකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii) ඉල්ලුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය :-

14.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර හතර (04) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් හා එක් එක් විෂය සමත් වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. :

| | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2. | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 3. | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව) | 100 | 50 |
| 4. | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව) | 100 | 50 |

අපේක්ෂකයන් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2 සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ

(i) සම්මුඛ පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i) ඉහත අංක 06 ඡේදයෙහි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එම සටහනෙහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාවය, නායකත්ව ගුණාංග, සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු විසිපහ (25) කි.

| | විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතාව | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂත්වය | 05 |
| | එකතුව | 25 |

ii. එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් සියළුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා, සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව හා අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

iv. පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන්වන (iii) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

*සැළකිය යුතුයි :*
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

15. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

01. සාමාන්‍ය බුද්ධිය
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් හා අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 1/2 යි, ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

02. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ හා ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ ගෝලීය තත්ත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන

තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 03 යි, ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

03. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)

රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට අදාළ රාජ්‍ය සේවයේ පිරිවැය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි. ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

04. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

දෙන ලද මාතෘකා/තේමා සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකා/තේමාව ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය හා පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3 යි- ලකුණු 100 යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 මැයි 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2013 (2014)

Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Administrative Service - 2013 (2014)

1.0 මාධ්‍යය—
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්

උදාහරණ : (GUNAWARDHANA, M. G. B. S. K.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

27. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න [ ]

2.8 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

2.9 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න
අවිවාහක - 1
විවාහක - 2 [ ]

2.10 ජන වර්ගය (සිංහල- 1 දෙමළ - 2, ඉන්දියන් දෙමළ -3 මුස්ලිම් - 4, වෙනත් - 5) - අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.11 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

2.12 දුරකථන අංකය [ | | | | | | | | | ]

3.0 ඔබ 2013.12.31 දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න :————.

4.0 (i) ගැසට් නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේද ? :—————.

(අ) 2013.12.31 දිනට වයස :—————.

(ආ) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද
ගැසට් නිවේදනයේ 06 (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 06 (ආ) i/(ආ) ii යන ඒවායින් කුමකින්ද ?
යන්න :—————.
උපාධිය ලද දිනය :—————.
විශ්ව විද්‍යාලය/ආයතනය :—————.
ලියාපදිංචි අංකය :—————.
බාහිර/අභ්‍යන්තර :—————.
උපාධිය :—————.
විෂයයන් :—————.
පන්තිය :—————.
ඉහළ/පහළ :—————.
උපාධිය වලංගු දිනය :—————.
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

(ඇ) විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් ඇත්නම්) සඳහන් කළ යුතුය. :—————.

දැනට දරන තනතුර :—————.
එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න :—————.
ශ්‍රේණිය :—————.
පන්තිය/බණ්ඩය :—————.
තනතුරට පත් වූ දිනය :—————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :—————.
වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :—————.

අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතුය.

| සේවය/ශ්‍රේණිය නම | අදාල රා. පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය උදා : MN2 - 2006 (A) | පත් වූ දිනය |
|---|---|---|
| (1) ………… | ………… | ………… |
| (2) ………… | ………… | ………… |
| (3) ………… | ………… | ………… |
| (4) ………… | ………… | ………… |
| (5) ………… | ………… | ………… |

(ii) ගැසට් නිවේදනයේ 6 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2013.12.31 දිනට සක්‍රිය හා සතුටුදායක මුළු සේවා කාලය :

5.0 මුදල් ගෙවූ කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න :

| |
|---|
| ලදුපත (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි දාරයක් මෙහි අලවන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

6.0 අයදුම්කරුගේ සහතිකය : 2013.12.31 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධික හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, ගැසට් නිවේදනයේ 06 ආ ඡේදයට අනුව 2013.12.31 දිනට සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක........ හා............. වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

7.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන………… මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන/පළාත් සභාව යටතේ වන……………… අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ……………… තනතුරක සේවය කරන බවද, 2013.12.31 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට/(අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, ගැසට් නිවේදනයේ 06 ආ ඡේදයට අනුව අවුරුදු ………… (පහක/දහයක) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවද, අදාළ ගැසට් නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බවද, මෙයින් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :—————.

පදවි නාමය :—————.

දිනය :—————.

(නිල මුද්‍රා යොදන්න)

06-175

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### තනතුරු ඇබෑර්තු

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය/ පුහුණු කිරීමේ ශ්‍රේණිය
(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය
(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය
(iv) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

1.0 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රාජකාරි කටයුතු සිදුකරන වැඩබිම් දිවයින පුරා විසිරී ඇති අතර, එම වැඩබිම්වල ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා කාර්මික නිලධාරීන් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. වැඩිමනත් ඉදිකිරීම් කටයුතු සිදුවන උතුර හා නැගෙනහිර පළාත් සඳහා නව කාර්මික නිලධාරී (සිවිල්/විදුලි) හා කාර්මික නිලධාරී (සිවිල්) - පුහුණු කිරීමේ ශ්‍රේණිය යෙදවීමට ඒ අනුව අපේක්ෂා කරන අතර, කාර්මික නිලධාරී (යාන්ත්‍රික) සහ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) ප්‍රධාන කාර්යාලය වෙත අනුයුක්ත කෙරේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2014.06.30 වැනි දිනට හෝ එදිනට ප්‍රථම, "අධ්‍යක්ෂ" ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07," යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික) හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන්වන ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කල රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද යටත් විය යුතුය.

4.0 සාමාන්‍ය සුදුසුකම් :

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.3 බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතු ය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

5.0 සියලුම තනතුරු සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

හා

5.2 ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවට විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

6.0 වෘත්තීය සුදුසුකම් :

6.1 **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික), III ශ්‍රේණිය** -
ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ක්‍ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

6.2 **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය**

ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් වෘත්තිය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාල සහතිකය ලබා තිබීම.

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම ;

*හෝ*

(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂෙත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම ;

*හෝ*

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන :* ඉහත 5.0 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.2 හි සඳහන් කාර්මික නිලධාරි (සිවිල්) -පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා (එක් වසරක පුහුණුවක්) නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

6.3 **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)-**

ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ක්ෂෙත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තිය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

(i) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම ;

*හෝ*

(ii) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක සැළසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

හෝ

(iii) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

(iv) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන .-* ඉහත 5.0 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.3 හි සඳහන් සැලසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) සඳහා නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

7.0 *තෝරා ගැනීමේ පදනම :*

7.1 *ලිඛිත තරඟ විභාගයේ කොන්දේසි :*
මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මඟින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරඟ විභාගයකට යොමුකරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර සුදුස්සන් එම ලකුණු අනු පිළිවෙල අනුව තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂාකරනු ලැබේ.

7.3 ලිඛිත තරඟ විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 1 කි. | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 කි. | 100 | 40 |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා බණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | *කාර්මික නිලධාරි (සිවිල්) තනතුර :* මාන, සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මගින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම. |

ප්‍රශ්න පත්‍රයේ නම — විෂය නිර්දේශය

*කාර්මික නිලධාරි (විදුලි) තනතුර* :

ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ පිළිබඳ දැනුම, අනුගමනය කළයුතු රෙගුලාසි, සැළසුම් පිළිබඳ දැනුම, ඇස්තමේන්තු සැකසීම හා පරිපථවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම.

*කාර්මික නිලධාරි (යාන්ත්‍රික) තනතුර* :

වාහන වර්ගීකරණය, අලුත්වැඩියාවේ දී හා සේවා කිරීම් වලදී භාවිතා වන ආයුධ, එන්ජිමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය, සිසිලන පද්ධතිය පිළිබඳ හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය පිළිබඳ දැනුම, සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ දැනුම හා එහි එක් එක් කොටසෙහි කාර්ය භාරය හා විවිධ වර්ගයේ සම්ප්‍රේෂණ පද්ධති පිළිබඳ, විදුලි පද්ධතිය පිළිබඳ, සුක්කානම් පද්ධතිය, අවලම්බන පද්ධතිය, බැටරි වර්ගීකරණය හා පිරිවිතර සකස් කිරීම, ටයර් වර්ගීකරණය පිළිබඳ දැනුම, ටයර් අංකනය කර ඇති ජාත්‍යාන්තර ප්‍රමිතිය පිළිබද දැනුම, බොඩියේ කොටස් පිළිබඳ දැනුම, ටයර් පද්ධතිය (Wheel Alignment) තබා ගැනීම හා ටයර් තුලනය (Wheel Alignment) කිරීම, වාහනයේ වායු සමීකරණ වර්ගීකරණය පිළිබඳ දැනුම, වාහනයේ වායු සමීකරණ පද්ධතියේ එක් එක් කොටසෙහි කාර්යභාරය, ගොඩනැගිලි සඳහා භාවිතා කරන වායු සමීකරණ යන්ත්‍ර වර්ගීකරණය පිළිබඳ, කාර්යාල උපකරණ වර්ගීකරණය පිළිබඳ දැනුම.

*සැළසුම් ශිල්පී තනතුර* :

සුදුසු පරිමාණයකට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙල කිරීමේ හැකියාව.

7.4 ලිඛිත තරඟ විභාගය සිංහල/දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ.

8.0 *බඳවා ගැනීම* :

ඉහත 5.0 සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික) හා කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය, සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)ට බඳවා ගනු ලැබේ.

9.0 *වැටුප් පරිමාණය* :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(iv)හි, MN-3-2006A යටතේ

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/විදුලි/යාන්ත්‍රික), III ශ්‍රේණිය :
රු. 15,005- 4 x 180-6 x 240 - 11 x 320 - 20 x 360 - 27,885/-

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය: රු 12,920 - 1 x 120 - රු. 13,040

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය):
රු.12,920 - 1 x 120 - රු. 13,040/-

10.0 *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු.1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු.1,000ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මඟින් (උපතැපැල් කාර්යාල හැර) "SLIDA" ගිණුම වෙත ගෙවිය යුතු අතර, ඒ ගෙවීමට අදාළව ලබා දෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇතුළත් කළ යුතුයි.

අදාළ තැපැල් කාර්යාලයේ දී "SLIDA" ගිණුම වෙත මුදල් ගෙවීමේ ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී, මුදල් ලබා ගන්නා ලෙස "SLIDA" යන්න ද, මුදල් ලබාගන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න. (සංකේත නාමයන් පහත වගුවේ දක්වා ඇත.)

| | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය/ පුහුණු කිරීමේ ශ්‍රේණිය | TOc |
| 02 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය | TOe |
| 03 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය | TOm |
| 04 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) | TOd |

තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුළත්කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.

11.0 යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12.0 *අත්සන සහතික කිරීම* :

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වේ.

ජී. බෝගහවත්ත,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

2014 මැයි මස 16 වැනි දින,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය
**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය/පුහුණු කිරීමේ ශ්‍රේණිය
(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය
(iv) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (යාන්ත්‍රික), III ශ්‍රේණිය
(v) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සැළසුම් ශිල්පී), පුහුණු කිරීමේ ශ්‍රේණිය
(අදාළ අංකය කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න.)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ලිඛිත තරග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - S
දෙමළ - T

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම :————.

(ii) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) :————.

02. *ලිපිනය හා දුරකථන අංක :*

(i) කාර්යාලයීය ලිපිනය :————.

දුරකථන අංකය :————.

(ii) පෞද්ගලික ලිපිනය :————.

(iii) දුරකථන අංකය :————. (iv) ජංගම දුරකථන අංකය :————.

03. *ස්ත්‍රී/පුරුෂ භාවය :*
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

06. *විවාහක/අවිවාහක බව :*
අවිවාහක - 1
විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :————.

(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.) :

විභාගය සමත් වූ වර්ෂය :————. මාසය :————. දිනය :————.

අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................. | ......... | .................. | ......... |
| .................. | ......... | .................. | ......... |

10. අනෙකුත් සුදුසුකම් : තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.) :————.

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :————.

ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්යය බව සලකන්න.

12. *විභාග ගාස්තු :*

මුදල් ගෙවූ රිසිට් පත් අංකය | S | L | D | | | | | | | | | | | |

රු.1,000 ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ..................................................................
(සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ..................................

දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

14. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තව ද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණී

මෙම ඉල්ලුම්කරු වන ............................ මහතා/ මහත්මිය/ මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ........... ............................... වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

තනතුර :————. ————.
දිනය :————. (නිල මුද්‍රාව)

06-28

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරි ගණයේ I පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2012

මෙම දෙපාර්තමේන්තුවේ I පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 20 ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවලට සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවලට දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.07.07 දින වේ.

*සටහන* : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :
ලිඛිත විභාගයක් හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ සෑම අයදුම්කරුවෙකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතු ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ට වඩා ලබාගත් අයදුම්කරුවන් අතරින් උපරිම ලකුණු ලබා ගත් අය පවතින පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලැබේ.)

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. වැටුප් පරිමාණය :
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට බාහිර පදනම මත බඳවා ගන්නා නිලධාරීන් වර්ෂ තුනක පරිවාස කාලසීමාවකට යටත් වේ. අභ්‍යන්තර පදනම මත බඳවා ගන්නා නිලධාරීන් එක් වර්ෂයක වැඩ බලන කාලසීමාවකට යටත් වේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද,

රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

4. සුදුසුකම් :

4.1 බාහිර අයදුම්කරුවන් සඳහා : පුරප්පාඩු 07 යි.

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) තනතුර සඳහා

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක පන්ති සාමාර්ථයක් සහිත මුද්‍රණ තාක්ෂණ උපාධියක් හෝ රසායන විද්‍යාව/පරිගණක විද්‍යාව (ප්‍රධාන විෂයක් වශයෙන්) සමග විද්‍යා උපාධියක් ලබා තිබීම;

හෝ

(ii) මුද්‍රණ ඉංජිනේරු උපාධියක් හෝ ඉංජිනේරු (යාන්ත්‍රික/ විදුලි/විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/නිෂ්පාදන) උපාධියක් ලබා තිබීම;

හෝ

(iii) විද්‍යා උපාධියක් සමග රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වසර 05 ක සේවයක් තිබීම;

හා

(iv) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මුද්‍රණ ශිල්පීය පාඨමාලා 02 ක් හදාරා තිබීම. (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

4.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : පුරප්පාඩු 08 යි.

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) තනතුර සඳහා

(i) මුද්‍රණ සේවයේ ප්‍රධාන වැඩමූලික හෝ වැඩමූලික II ශ්‍රේණියේ තනතුරක් දරන නිලධරයකු වීම ;

හා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳව පාඨමාලා 02 ක් හදාරා සහතික ලබා තිබීම. (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

හෝ

(ii) මුද්‍රණ සේවයේ ප්‍රධාන මුද්‍රණ සංස්කාරක හෝ මුද්‍රණ සංස්කාරක II ශ්‍රේණියේ තනතුරක් දරන නිලධරයකු වීම

හා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හා පිළිගත් ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳව පාඨමාලා 03 ක් හදාරා සහතික ලබා තිබීම. (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්නතම වසර 05 ක කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු) තනතුර සඳහා - පුරප්පාඩු 03 යි

(i) මුද්‍රණ සේවයේ ප්‍රධාන වැඩමූලික (නඩත්තු) හෝ වැඩමූලික II ශ්‍රේණියේ (නඩත්තු) තනතුරක් දරන නිලධරයෙකු වීම;

(ii) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳව පාඨමාලා 02 ක් හදාරා සහතික ලබා තිබීම. (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

හෝ

I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ ෆෝමන් තනතුරුවල ඒකාබද්ධ දස වසරක (10) පළපුරුද්දක් සහිත I ශ්‍රේණියේ (ප්‍රධාන වැඩ මූලික) ෆෝමන්වරයෙකු වීම;

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්නතම වසර 05 ක කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (මුද්‍රණ සංස්කාරක) තනතුර සඳහා - පුරප්පාඩු 02 යි

(i) මුද්‍රණ සේවයේ ප්‍රධාන මුද්‍රණ සංස්කාරක හෝ මුද්‍රණ සංස්කාරක II ශ්‍රේණියේ තනතුරු දරන නිලධරයෙකු වීම;

හා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳව පාඨමාලා 02 ක් හදාරා සහතික ලබා තිබීම (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්නතම වසර පහ (05) ක කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5. කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්;

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6. *වයස් සීමාව* : අවුරුදු 22 ට නොඅඩු හා 28 ට නොවැඩි විය යුතු වේ.

(දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක සේවය කරන අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

7. *වෙනත් සුදුසුකම්* :-

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය;

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයකු නොවිය යුතු ය.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. 8.1 ලිඛිත විභාගය :

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2 විෂයය නිර්දේශය :

මුද්‍රණ සේවයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් ලිඛිත පරීක්ෂණයක් පැවැත්වේ.

| | | | |
|---|---|---|---|
| (i) | අවබෝධය | පැය 02යි | - ලකුණු 100 යි |
| (ii) | සාමාන්‍ය බුද්ධිය | පැය 01 යි | - ලකුණු 100 යි |
| (iii) | සාමාන්‍ය දැනුම | පැය 02 යි | - ලකුණු 100 යි |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| (අ) අවබෝධය | මෙම ප්‍රශ්න පත්‍රය මඟින් කෙටි වාක්‍ය කිහිපයක අදහස එක වාක්‍යකින් ප්‍රකාශ කිරීම, යටින් ඉරි ඇඳි පද වලට විවරණ සැපයීම. විකල්ප ප්‍රකාශ කීපයක් අතුරින් දෙනු ලබන පාඨයේ අන්තර්ගත කරුණු වලට වඩාත්ම ගැලපෙන ප්‍රකාශය තෝරා ගැනීම, දෙනු ලබන ඡේදයක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම හා දෙන ලද තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක අන්තර්ගත ප්‍රධාන අදහස් තමාගේ වචනයෙන් සාරාංශ වශයෙන් ඉදිරිපත් කිරීම මඟින් අපේක්ෂකයා සතු අර්ථය වටහා ගැනීමේ ශක්තිය හා නිරවුල් ප්‍රකාශ කිරීමේ හැකියාව මැන බැලීම මින් අදහස් කෙරේ. |
| (ආ) සාමාන්‍ය බුද්ධිය | පදගත, සංඛ්‍යාත්මක හා රූපකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කරන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් ඔවුන්ගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| (ඇ) සාමාන්‍ය දැනුම | අපේක්ෂකයා වාසය කරන පරිසරයද ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් හා මුද්‍රණ විෂය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අදහස් කෙරේ. ප්‍රශ්න කිහිපයක් අතුරින් තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අපේක්ෂකයින්ට අවස්ථාව ලැබේ. |

මුද්‍රණ සේවයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය පහත සඳහන් විෂයන්ගෙන් ලිඛිත පරීක්ෂණයක් පැවැත්වේ.

| | | | |
|---|---|---|---|
| (i) | සාමාන්‍ය පරිපාලනය | පැය 03 යි | ලකුණු 100 යි |
| (ii) | මුද්‍රණ ශිල්පය | පැය 03යි | ලකුණු 100 යි |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| (අ) සාමාන්‍ය පරිපාලනය | ආයතන සංග්‍රහයේ විධි විධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි හා දෙපාර්තමේන්තු නියෝග පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න වලින් සමන්විත වේ. |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| (ආ) මුද්‍රණ ශිල්පය | (i) පෙර මුද්‍රණය -<br>ටයිප්සෙටින් කිරීම, පිටු ලේ-අවුට් කිරීම, පරිගණක රූ රටා නිර්මාණය, ප්‍රොසෙස් කැමරා වැඩ, ඡායා පටල යොදා සැලසුම් කිරීම හා ලේ- අවුට් කිරීම, රිප් කිරීම, ඉමේජ් සෙටින් කිරීම, ප්ලේට් සෑදීම, පොලිමර් ප්ලේට් සෑදීම.<br><br>(ii) මුද්‍රණය<br>ඔෆ්සෙට් ලිතෝ පත් මුද්‍රණය, ඔෆ්සෙට්, ලිතෝ වෙබ් මුද්‍රණය, ලෙටර් ප්‍රෙස් පත් මුද්‍රණය, ලෙටර් ප්‍රෙස් රොටරි මුද්‍රණය.<br><br>(iii) පසු මුද්‍රණය-<br><br>කැපීම, නැවීම, ගැදර් කිරීම හා ඉන්සෙට් කිරීම, වයර් ගැසීම, සෙක්ෂන් මැසීම හා පර්ෆෙක්ට් බයින්ඩින් කිරීම, කේස් කවර සෑදීම, ලෙජර් සෑදීම, ෆොයිල් කිරීම, නැවත බැඳීම හා විශේෂ බයින්ඩින් වැඩ.<br><br>(iv) වෙනත් -<br>ඩයියොදා කැපීම, බ්ලයින්ඩ් එම්බෝස් කිරීම, ෆොයිල් ලැමිනේට් කිරීම, ක්රීස් කිරීම හා පර්පරේට් කිරීම, පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය, ආරක්ෂිත මුද්‍රණය.<br><br>(v) අනාගත අවශ්‍යතාවය -<br>ප්ලේට් සෙටින් කිරීම, කන්ටිනුවස් ස්ටේෂනරි මුද්‍රණය, ඩිජිටල් මුද්‍රණය.<br><br>(vi) කම්පයිල් කිරීම (Compiling)<br>පූර්ව සංස්කරණය, සෝදුපත් කියවීම, යන්ත්‍ර සෝදුපත් පරීක්ෂා කිරීම.<br><br>(vii) යන්ත්‍ර හා උපකරණ වල යාන්ත්‍රික කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, යන්ත්‍ර හා උපකරණ වල විද්‍යුත් කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, යන්ත්‍ර හා උපකරණ වල ඉලෙක්ට්‍රොනික කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, පරිඝනක සහ උපාංගවල ඉලෙක්ට්‍රොනික කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, ගොඩනැගිලි (විද්‍යුත් කොටස් ඇතුලුව) නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම.<br><br>(ඉහත සඳහන් සෑම කොටසකින්ම ප්‍රශ්න ඉදිරිපත් කරන අතර ඉන් කැමති කොටස් 4 කින් ප්‍රශ්න හතර (04) ට පිළිතුර සැපයීමට අයදුම්කරුවන්ට අවස්ථාව සලසනු ලැබේ.) |

8.2 සම්මුඛ පරීක්ෂණය :

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ) ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - බඳවා ගැනීම් පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ

සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

9. විභාග කොන්දේසි :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුර දිය යුතුය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම බාහිර අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර තුනකට (03) පෙනී සිටිය යුතු අතර, සෑම අභ්‍යන්තර අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකකට (02) පෙනී සිටිය යුතුය.

(ii) විභාග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සටහන*** : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කල යුතු අතර, බාහිර අයදුම්කරුවන් තම අයදුම්පත්, 1.0 සිට 2.11 වන තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද, 3.0 සිට 6.0 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස සකස් කල යුතු අතර, අභ්‍යන්තර අයදුම්කරුවන් තම අයැදුම්පත් 1.0 සිට 2.11 වන තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද, 3.1 සිට 7.0 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කල යුතු බවත් ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කල යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි. මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව අයදුම්පත් සකසන්න.

(vii) ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම පුවත්පත් නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සියේ පිටපතක්ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම ලිපියකින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* : විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

***සැළකිය යුතුය*** :

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවාද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත්

නිලධාරියෙකු, රු. 2,40,360ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැනදැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

2014 ජුනි මස 06 වැනි දින.
චරිත හේරත්,
ලේකම්,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය.

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ විධායක නිලධර ගණයේ I වැනි පංතියේ III වැනි ශ්‍රේණියේ සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - මුද්‍රණ යාන්ත්‍රික), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු - ඉලෙක්ට්‍රොනික), සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (මුද්‍රණ සංස්කාරක) යන තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2012**

**ඉල්ලුම්පත්‍රය**

**Application for the Limited Competitive Examination for Recruitment to Executive Service Cadre Class I Grade III in the Printing Service, Assistant Government Printer (Production), Assistant Government Printer (Maintenance - Printing - Mechanical), Assistant Government Printer (Maintenance - Electronics), Assistant Government Printer (Printing Editor) in the Department of Government Printing - 2012**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : (SILVA, A. B.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී - 1) : [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.7 විවාහක/අවිවාහක බව : [ ]
(අවිවාහක - 1 විවාහක -2)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.8 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

2.9 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

2.10 ඉල්ලුම්පත් භාරගන්නා
අවසාන දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

2.11 දුරකථන අංකය (තිබේ නම්) : [ | | | | | | | | | ]

3.1 ඔබ විසින් ඉල්ලුම්කරනු ලබන තනතුර : [ ]

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) - 01
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති - 02
(නඩත්තු - මුද්‍රණ යාන්ත්‍රික)
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති - 03
(නඩත්තු - ඉලෙක්ට්‍රොනික)
සහකාර රජයේ මුද්‍රණාලයාධිපති - 04
(මුද්‍රණ සංස්කාරක)
(ඔබ ඉල්ලුම් කරනු ලබන තනතුරට අයත් අංකය හිස් කොටුව තුළ සඳහන් කරන්න.)

3.2 ඔබ විසින් විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් යොමු කිරීමට බලාපොරොත්තු වන්නේද ? :————.

4.0 සුදුසුකම් පිළිබඳ තොරතුරු :————.

4.1 ඔබ විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දැනට දරනු ලබන තනතුර හා දැනට සේවය කරනු ලබන අංශය :————.

4.2 ඔබ විසින් මුද්‍රණ ශිල්පය පිළිබඳව හදාරා ඇති පාඨමාලාවන් හා එම පාඨමාලා හදාරා ඇති ආයතන පිළිබඳ විස්තර :————.

5.0 මුදල් කුවිතාන්සිය :

(ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, අංක 1816/12 හා 2013.06.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව මෙම තනතුරට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් මා විසින් සපුරා ඇති බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............හා ............වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (දැන්වීමේ 9 (ඈ) පරිදි විය යුතුය.)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන........................ (සම්පූර්ණ නම) යන අය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්............. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 අයදුම්කරු සේවය කරන අංශය භාර මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය ඃ

මෙම අයදුම්කරු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ................. අංශයේ ................. තනතුරක් දරන නිලධාරියකු වශයෙන් සේවය කරන බවට සහතික කරමින්, ඔහුගේ මෙම අයදුම්පත ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

————,
(අංශ භාර මාණ්ඩලික නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අංශ භාර මාණ්ඩලික නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය ඃ

මෙම නිලධාරියා අංක 1816/12 හා 2013.06.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව ඉහත 3.0 හි සඳහන් තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති බවත්, ඔහු/ඇය විසින් සඳහන් කර ඇති කරුණු නිවැරදි බවත්, ඔහු/ඇය 2014 ......... දින සිට පූර්වාසන්න වසර 05 ක් තුළ කිසිදු විනය නියෝගයකට යටත් නොමැති බවත්, එසේ කිරීමට අදහස් කර නොමැති බවත් ඉහත දිනට පූර්වාසන්න වසර පහක කාලයක් තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවත් සහතික කරමි.

————,
(පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික නිලධාරියාගේ අත්සන)

දිනය :————.
පෞද්ගලික ලිපිගොනු භාර මාණ්ඩලික නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ විධායක නිලධර ගණයේ I වැනි පංතියේ III වැනි ශ්‍රේණියේ සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2012

ඉල්ලුම් පත්‍රය

Application for the Open Competitive Examination for Recruitment to Executive Service Cadre, Class I Grade III in the Printing Service in the Department of Government Printing - 2012

1.0 මාධ්‍යය
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු ඃ

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ ඃ (SILVA, A. B.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී - 1) ඃ
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.7 විවාහක/අවිවාහක බව ඃ
(අවිවාහක - 1 විවාහක -2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.8 ජාතික හැඳුනුම්පත් අංකය

2.9 උපන් දිනය ඃ වර්ෂය මාසය දිනය

2.10 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු මාස දින

2.11 දුරකථන අංකය (තිබේ නම්) | | | | | | | | | | |

3.0 (i) උපාධිය ලද දිනය (මෙම සුදුසුකම් ඇත්දැයි බැලීමට ගැසට් නිවේදනයේ 7(ii) කරුණාකර හොඳින් කියවා බලන්න) :—————.

(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :—————.

(iii) ලියාපදිංචි වූ අංකය :—————.

(iv) බාහිර/අභ්‍යන්තර :—————.

(v) උපාධිය :—————.

(vi) විෂයයන් :—————.

(vii) පන්තිය :—————.

(viii) ඉහළ/පහළ :—————.

(ix) විභාග අංකය :—————.

(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

4.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

(ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

5.0 *අයදුම්කරුගේ සහතිකය* ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ……………… හා ………………වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 9 (ඈ) පරිදි විය යුතු ය.) ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන…………………… (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්…………. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

—————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :—————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

06-465

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජුනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2014.08.01 | සිකුරාදා | 2014.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.08 | සිකුරාදා | 2014.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.15 | සිකුරාදා | 2014.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.22 | සිකුරාදා | 2014.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.29 | සිකුරාදා | 2014.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.